කෑගල්ල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම.

2010 ජනවාරි 19 දිනැති අංක PED 54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට සියළුම පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතිවලට අනුව පිළියෙල කළ යුතු වුවත් එම ප්‍රමිතීන් අනුගමනය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 309,556 ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද බෙහෙත් තොග නිකුත් කිරීම් වටිනාකම රු.89,111 ක් වුවද, වර්ෂයේ මිලදී ගැනීම් වටිනාකම වූ රු.162,782 ක් වියදම් යටතේ දැක්වීම හේතුවෙන් වර්ෂයේ වියදම් රු. 73,671 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයන්හි මුද්දර ආදායම් ගණනය කිරීම වෙනුවෙන් ගෙවන ලද දිරිදීමනා රු. 82,575 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරියෙකුගේ රු. 136,300 ක ණය ශේෂයක් හා ස්ථාන මාරුවී ගිය නිලධාරිනියකගේ රු. 126,150 ක ණය ශේෂයක් නිරවුල් කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන මඟින්ද, හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ට අයත් රු. 5,888,000 ක් වූ වාහන 05 ක අයිතිය සභාවට පවරා නොගෙන ගිණුම් ගතකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා උසාවි දඩ මුදල් ගණනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ දිරිදීමනා රු. 45,854 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(උ) ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුමේ ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පත් ගිණුමේ ශේෂය බැර ශේෂයක් විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 234,868 ක හර ශේෂයක් පැවතුණි.

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 05 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 13, 851,763 වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 9,467,112 ක් වූයෙන් වෙනස රු. 4,384,651 ක් විය.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 6,319,915 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 2,402,081 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 7,160,908 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු. 363,922 ක් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

2014 ජුනි 13 දින වන විට විගණන විමසුම් 03 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර , එකී විමසුම් වලට භාජනව වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.11,796,260 ක් විය.

1.3.6 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව</u> | <u>අනුකූල නොවීම්</u> |
|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| 371(2) (ඇ) | 2005 ජනවාරි 19 දින සුනාමියෙන් විපතට පත් වූවන්ට සහන සැලසීම සඳහා සභාපතිවරයා ලබාගත් රු. 25,000 ක අත්තිකාරම් මුදල 2014 ජුනි 20 දිනය වන විටත් පියවා නොතිබුණි. |
| (ආ) <u>සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය</u> | |
| 422.2 රීතිය | ප්‍රසම්පාදන ක්‍රියා මාර්ග අනුගමනය කිරීමකින් තොරව මහා සභාවේ තීරණය මත පමණක් රු. 604,525 ක් වැයකර වීථි ලාම්පු කට්ටල 80 ක් හා ඩිජිටල් කැමරාවක් මිලට ගෙන තිබුණි. |

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත හා සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්ගේ 2005 ජුනි 01 දිනැති <u>අංක 2005/14දරන චක්‍රලේඛය</u>

| | |
|---|---|
| 3(ii) | ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබූ අක්කර 18 රූඩ් 2 පර්චස් 32 කින් යුත් ඉඩම් කට්ටි 5 ක් වෙනුවෙන් 1% ක බදු මුදල සභාවට නොගෙවීම සම්බන්ධව නීති ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| 3(iii) | හෙක්ටයාරයකට වැඩි ඉඩම් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේදී එම ඉඩම් ප්‍රමාණයෙන් 10% ක භූමි භාගයක් ඔප්පුවක් මගින් සභාවට පවරාගත යුතු වුවද, අක්කර 18 ½ ක ප්‍රමාණයෙන් යුතු හෙක්ටයාරයකට වැඩි ඉඩම් 5 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතුනොකිරීම නිසා පර්චස් 331.28 ක බිම් ප්‍රමාණයක් සභාවට අහිමිව තිබුණි. |

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 16,077,745 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,972,423 ක් විය.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලය රු. 7,105,322කින් වර්ධනයට වෙනත් ආදායම්වල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සීමාව ඉක්මවා රු. 2,085,000 ක තත්‍ය වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය

| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 1,394 | 829 | 363 |
| (ii) බදු කුලී | 1,005 | 957 | 277 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,132 | 1,460 | 14 |
| (iv) වෙනත් ආදායම් | 3,350 | 42,020 | 14,463 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.11,764,742 ක් විය.

2.3.3 දැන්වීම් පුවරු ගාස්තු

ආදායම් පරිපාලක විසින් භාරදෙන ලද දැන්වීම් පුවරු පිළිබඳ තොරතුරු වලට අනුව දැන්වීම් පුවරු 05කින් ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් සභාවට රු.16,800 ක ආදායමක් අහිමි වී තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 4,772,205 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු. 58,965 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැටුප් රහිත නිවාඩු සඳහා අයකිරීම් ගණනය කිරීමේදී සියළු දීමනා සහිත වැටුප පදනම් කර ගතයුතු වුවත්, ඒකාබද්ධ වැටුප පමණක් පදනම් කර ගැනීමෙන් සභා අරමුදලට 2012 වර්ෂයේදී රු.49,938 ක මූල්‍ය පාඩුවක් සිදුව තිබූ අතර, එක් සේවකයෙකු සමාලෝචිත වර්ෂයේදී ලබාගත් වැටුප් රහිත නිවාඩු දින 44 ක් සඳහා අයකරගත යුතුව තිබූ රු.33,808 ක් අයකරගෙන නොතිබුණි.

(ඇ) අනතුරුදායක ගස් කපා ඉවත්කර ගැනීම සඳහා 2010 වර්ෂයේ සිට 2013 දක්වා වර්ෂ 04 ක් තුළදී සභාවට ලැබී තිබුණු අයදුම්පත් 819 ක් අතරින් පරීක්ෂණ කටයුතු සඳහා භාරගත් ක්ෂේත්‍ර නිලධාරින් ආපසු භාරදී නොමැති සංඛ්‍යාව 91 ක් විය.

(ඈ) ගොඩනැගිලි සැළසුම් කමිටු සාමාජික දීමනාව එක් එක් දිනය වෙනුවෙන් රු.750 බැගින් ගෙවීමට 2012 සැප්තැම්බර් 28 දින සභා තීරණයක් ගෙන තිබුණද, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, නියැදි පරීක්ෂණයට අනුව ගොඩනැගිලි සැළසුම් කමිටුව ප.ව.4.15 සිට 4.45 දක්වා පැය භාගයක කාලයක් වෙනුවෙන්ද, ඉහත දීමනාව ගෙවා තිබුණු අවස්ථා 05 ක් නිරීක්ෂණය විය.

(ඉ) 2013 වර්ෂයේ පැවැත්වූ නිවාස සැළසුම් කමිටු 20 කදි සලකා බලන ලද නිවාස අයදුම්පත් පිළිබඳ පරීක්ෂාවේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ සහභාගීත්වය නොමැතිව නිවාස අයදුම්පත් 167 ක් අනුමතකර තිබුණි.

(ඊ) 2010 වර්ෂය සඳහා මොරොන්තොට පිහිටි සභාවට අයත් දෙමහල් ගොඩනැගිල්ලක් ටෙන්ඩර් කැඳවා මාසික කුලිය රු.6,100 ක් බැගින් ගිවිසුමක් මත බදු දී තිබුණු අතර, 2013 වර්ෂය දක්වාම නැවත ටෙන්ඩර් කිරීමකින් තොරව හා බදු ගිවිසුමකට එළඹීමකින් තොරව පෙර බදු කරුට එම ගොඩනැගිල්ල පරිහරණය කිරීමට ඉඩදී තිබුණි. වාර්ෂික බදු මුදල වැඩි කිරීමෙන් ලබාගත හැකිව තිබූ ආදායමක් සභාවට අහිමිවී තිබූ අතර 2006 වර්ෂයෙන් පසුව 2013 දක්වා වර්ෂ 08 ක් ගතවී තිබුණද, ගොඩනැගිල්ල නැවත තක්සේරු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(උ) සභාවට අයත් පොදු වෙළඳපල කඩකාමර බදු දීමේදී අදාල බදු ගිවිසුම් වලට අනුව එක් එක් මාසයේ බදු මුදල එම මාසයේ 10 දිනට පෙර ගෙවිය යුතු අතර, නියමිත දිනට බදු මුදල් නොගෙවන විට තැන්පත් මුදලින් හිග මුදල් අයකරගෙන බදුකරු කඩකාමරයෙන් නෙරපා හැරිය යුතු වුවද, ආරක්ෂිත ඇප තැන්පතුව අවසාන වන තෙක් ගිවිසුම් ප්‍රකාර නිසි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් කඩ කාමර 04 කින් රු.49,365 ක මුදල් අයකරගත නොහැකිව තිබුණි.

(ඌ) ණයහිමි ගිණුමෙහි ඇතුළත් වසර 08 කට වඩා පැරණි ණයහිමි ශේෂ 75 ක් සඳහා ගෙවිය යුතුව තිබූ රු. 1,014,550 ක ශේෂයක් අනුමැතියකින් තොරව ඉවත් කර තිබුණි.

3.2 <u>නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්</u>

(අ) සභාවට අයත් රු. 70,000 ක් වූ තාර බොයිලේරුව වසර 08 ක් තිස්සේ නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අවලව පවතින වත්කම් වල අගය රු. 504,440 ක් විය.

3.3 <u>හදුනාගත් අලාභ</u>

මීදෙණිය, ගඟුල්දෙණිය ගම්සභා පාර පටුවන ලෙසට පැති බැම්මක් ඉදිකිරීම සම්බන්ධව හෙට්ටිමුල්ල මීදෙණිය පදිංචිකරුවෙකුගෙන් රු.50,000 ක අලාභයක් අයකර ගැනීම පිණිස 2004 මාර්තු 24 දින කෑගල්ල දිසා අධිකරණයේ පවරණ ලද අංක 7027 දරන ඉඩම් නඩුව 2013 මාර්තු 06 දින විත්තිකරුගේ ගාස්තුවට යටත්ව ඉල්ලා අස්කරගෙන තිබුණි. නඩු පැවරීමේ අරමුණ වූ පැතිබැම්ම ඉවත්කර ගැනීම හෝ රු.50,000 ක අලාභය අයකර ගැනීමට කටයුතු නොකර විත්තිකරුට ගාස්තු ගෙවීමට යටත්ව නඩුව ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් සභාවට අලාභයක් සිදුවී තිබුණි.

3.4 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

ඉදිකිරීම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පරික්ෂණ වලදී දක්නට ලැබුණු අඩුපාඩු පහත දැක්වේ.

(i) පෙර මුසු (ප්‍රිමික්ස් ව්‍යාපෘතිය)

සභා බල ප්‍රදේශයේ මාර්ග අළුත්වැඩියා කටයුතු සඳහා සභා සේවකයින් යොදා ගනිමින් පෙරමුසු (ප්‍රිමික්ස්) ව්‍යාපෘතිය ක් පවත්වා තිබුණු අතර, 2012 සහ 2013 වර්ෂ දෙක තුළදී ප්‍රිමික්ස් කියුබ් 71.75 ක් මාර්ග අළුත්වැඩියාව සඳහා නිකුත්කර තිබුණද , මෙම ප්‍රිමික්ස් යොදාගත් ආකාරය දැක්වෙන පරිදි එක් එක් මාර්ගය සඳහා මිනුම් පත්‍ර හා වැඩ පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය මගින් නිෂ්පාදනය කරන ලද ප්‍රිමික්ස් වෙනුවෙන් දරන ලද නිෂ්පාදන පිරිවැය හා මාර්ග අළුත්වැඩියාව / ඉදිකිරීම් සඳහා සකස් කළයුතු වැඩ ඇස්තමේන්තු පිරිවැය ගලපා ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

(iii) කිරිකොහු තැන්න මාර්ගය කොන්ක්‍රීට් කිරීම හා පැති බැම්ම ඉදිකිරීම සඳහා 2012 මැයි 22 දින පුස්සැල්ල මහසෙන් ගොවි සංවිධානය සමඟ රු.968,888 ක ඇස්තමේන්තුගත වටිනාකමට අත්සන් කරන ලද ගිවිසුම් පත්‍රයේ වැඩ විෂය අංක 5 ට අනුව අනුමත පස් සපයා උපදෙස් පරිදි තැලීම වෙනුවෙන් පස් කියුබ් එකක් සඳහා රු.4,099 බැගින් පස් කියුබ් 23 ¾ වෙනුවෙන් රු.97,475 ක් ගෙවා තිබුණු නමුත් කොන්ක්‍රීට් දැමූ මාර්ගය හා පැති බැම්ම අතර අඩි 2 ½ ක පළලින් හා අඩි 30 ක් දිග තීරයක අඩියක පමණ ගැඹුරට පස් පුරවා මට්ටම් කර නොතිබුණි.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනකරණය